# ඡායා රූ පිළිසඳර

2012 ජනවාරි /පෙබරවාරි

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය

**Educational and News Bulletin of The National Photographic Art Soceity of Sri Lanka**


# සුබ නව වසරකට ආසිරි..






## 38 වන වාර්ෂික ඡායාරූප තරගය හා ප්‍රදර්ශනය

අප සංගමයේ 38 වන වාර්ෂික ඡයාරූප තරගය හා ප්‍රදර්ශනය, 2011 දෙසැම්බර් මස 16 වන සිකුරාදා පෙ.ව. 9.00 ට සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ විජිත් කණුගල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ ජාතික කලා භවනේ දී පැවැත්විණි. මෙම ප්‍රදර්ශනය දෙසැම්බර් මස 16 සිට 18 දක්වා මහජනයා සඳහා විවෘතව තැබිණ.

## අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම

සංගමයේ 2011/2012 අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම 2012 ජනවාරි මස 29 වන ඉරුදින නාරාහේන්පිට, ඇල්විටිගල මාවත, අංක. 354/2 හි පිහිටි නිපුණතා පියසේ දී (පොලිස් ගරාජය ඉදිරිපිට) පැවැත්වෙන බව සාමාජික සැමට දැනුම් දෙමු. ආරාධනා පත්‍රය මෙම පිළිසඳර කලාපයෙහි ඇතුළත් කර ඇත.

## 49 වන වාර්ෂික ඡායාරූප ශිල්ප පරීක්ෂණය - 2011

49 වන වාර්ෂික ඡායාරූප ශිල්ප පරීක්ෂණය 2012 ජනවාරි මස 22 වන ඉරුදින කොළඹ මහාබෝධි විද්‍යාලය හා කුරුණෑගල මධ්‍යස්ථාන දෙකෙහි දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් සඳහා අදාල තොරතුරු තැපැල් කර යවා ඇති බව අධ්‍යක්ෂ ලේඛකාධිකාරී ප්‍රකාශ කරයි.

## නව වසරේ පංති ආරම්භය

අභිනව වර්ෂය සඳහා නව පංති 2012 පෙබරවාරි මස 26 වන දින ආරම්භ කිරීමට නියමිතය. සුපුරුදු පරිදි ෆොස්ටර් පටුමගේ පිහිටි මහාබෝධි විද්‍යාලයේ ඉරු දිනවල ප.ව. 1.30 සිට ප.ව. 4.30 දක්වා පංති පැවැත්වේ.

**ඉදිරි පංති කාල සටහන**

මාර්තු :- 04, 11, 18, 25

අප්‍රේල් -: 01(විහාරමහා දේවී උද්‍යාන චාරිකාව), 29

මෙම කාල සටහනේ දක්වා ඇති දිනවල යම් වෙනසක් කිරීමට සිදු වුවහොත් එය ඊට පෙර සතියේ දී දැනුම් දෙනු ලබනු අතර, පංති පැවැත්වීම සහ චාරිකා පිළිබඳ වැඩිදුර විස්තර අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් හෝ පංති භාර උපදේශකවරුන්ගෙන් ලබා ගත හැකියි.

## නිල ආරාධනා පත්‍රය

**හිතවත් සාමාජික / සාමාජිකාවන් වෙත.**

### අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම - 2011/2012

අප සංගමයේ 2011/2012 වර්ෂයේ අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම පහත සඳහන් දින පැවැත්වීමට තීරණය කර ඇත.

**දිනය : 2012 ජනවාරි මස 29 වැනි ඉරුදින**
**වේලාව : උදෑසන නවයේ කණිසමට**
**ස්ථානය : නාරාහේන්පිට, ඇල්විටිගල මාවත, අංක 354/2 නිපුණතා පියස. (පොලිස් ගරාජය ඉදිරිපිට)**

මෙදින රැස්වීමට සාමාජික ඔබ සැමට ගෞරවයෙන් ආරාධනා කර සිටින අතර, ඔබගේ පැමිණීම ගෞරවයෙන් අපේක්ෂා කරමු. එමෙන් ම යෝජනා ඇතොත් කල් ඇතිව ලිඛිතව දැනුම් දෙන්න.

**ගරු අධ්‍යක්ෂ මණ්ඩලය**

### නවක සාමාජිකයින් බඳවා ගැනීම

අභිනව වර්ෂය සඳහා සංගමයට සාමාජික සාමාජිකාවන් බඳවා ගැනීම දැන් සිදුකෙරේ. ඒ සඳහා අයදුම් පත් යොමු කළ පිරිසට අවස්ථාව උදාවන අතර, 2012 ජන: 22 දින සිට ඉදිරි දින කීපයක් තුළ කොළඹ මහාබෝධි විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිත බව අධ්‍යක්ෂ/ලේඛකාධිකාරි හසිත ලියනගේ මහතා පිළිසඳරට පැවසීය. සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දින රැගෙන එන සහ ප්‍රමාදවී ලැබෙන අයදුම් පත් 2013 වසර සඳහා යොමු කෙරේ.

### විෂයමාලා සංශෝධනයක්

ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයකට අනුව ඉදිරියේ දී ඡායාරූප ශිල්ප තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ විෂයමාලාවන් සංශෝධනය කිරීමට බලාපොරොත්තු වේ. වර්තමානයේ ක්ෂේත්‍රය තුල සිදුවී ඇති වෙනස්කම් සැලකිල්ලට ගනිමින් මෙම තීරණයට එළඹ තිබේ. මේ නිමිත්තෙන් 2012 පෙබ: 12 ඉරිදා ප.ව. 1.30 ට මහබෝධි විදුහලේ දී පැවැත්වෙන සාකච්ඡාවට සහභාගී වන ලෙස පන්ති භාර ආචාර්යවරුන් ඇතුළු දේශන සඳහා සහභාගී වන සියළුම අචාර්යවරුනට ගෞරවයෙන් ඇරයුම් කෙරේ.

### අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වෙනසක්

පසුගිය මහා සභා වාරයේ දී ගරු අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන් තේරී පත් වූ වෛද්‍ය මංගලනාත් උඩුකල මහතා වැඩිදුර අධ්‍යාපන කටයුතු සඳහා විදේශ ගතවීමෙන් පුරප්පාඩු වූ එම තනතුරට රෝහිත ගුණවර්ධන මහතා (LM 141) පත්කර ගන්නා ලදී. සංගමයේ ව්‍යවස්ථාවට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ මහතා තෝරාපත්කර ඇත. රෝහිත ගුණවර්ධන මහතා ඡායාරූප ශිල්ප ඩිප්ලෝමාධාරියෙකු වන අතර පසු ගිය වසර 02 ක කාලය තුළ දෙවන වසර පංති භාර උපදේශකවරයා වශයෙන් කටයුතු කරයි. ඔහු වෘත්තියෙන් වනජීවී දෙපාර්තමේන්තුවේ අඩවි සහකාර වරයෙකි. ඔහුට පිළිසඳරේ සුභපැතුම්.

### සංගමයේ සභාපතිට විදෙස් සම්මානයක්

සයිප්‍රසයේ පිහිටි PESGS Photographic Club වෙතින් අප සංගමයේ ගරු සභාපති සුනිල් වික්‍රම මහතා වෙත Hon. PESGSPC යන ගරු සම්මානය, ඡායාරූප කලාවේ සංවර්ධනය හා දියුණුව උදෙසා සිදුකරන ලද දායකත්වය (For the outstanding contribution to the development and Progress of the Photographic Art) වෙනුවෙන් පිරිනමා ඇත ඒ නිමිත්තෙන් පිළිසඳරේ සුභපැතුම් හා ආචාරය.

### 2011 වර්ෂයේ FIAP ආයතනයේ සම්මාන ලාභීන්

අප සංගමයේ සාමාජිකයින් දෙපළක් සහ ප්‍රථම වරට සාමාජිකාවක් ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනය (International Federation of Photographic Art - FIAP) මගින් පිරිනමනු ලබන සම්මාන දිනා ගැනීමට පසුගිය වසරේ දී සමත්විය. එම සම්මානලාභීන් පහත දැක්වේ.

හෙන්රි රාජකරුණා මහතා : විශිෂ්ටතා සම්මානය (EFIAP)
චන්ද්‍රසේන පෙරේරා මහතා : කලාවේදී සම්මානය (AFIAP)
යමුනි රශ්මිකා පෙරේරා ම'මිය : කලාවේදී සම්මානය (AFIAP)

තව චිරාත් කලක් දේශීය ඡායාරූප කලාකෙත අස්වද්දනු පිණිස අපි ඔවුන් හට සුබපැතුම් පිළිගන්වමු.

### 2011 වර්ෂයේ ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය මගින් පිරිනමන සම්මාන

**ගරු සහාගී සාමාජිකත්ව** *(Hon. FNPAS)*
විජිත් කණුගල මහතා
සිතුමිණි රත්නමලල මහතා
ටී.එස්.ටී. ද සිල්වා මහතා

**සහාගී සාමාජිකත්වය** *(FNPAS)*
ශාන්ත ගුණරත්න මහතා

**ඇසුරු සාමාජිකත්වය** *(ANPAS)*
එම්. එල්. සංඛ සම්මාන පෙරේරා මහතා

**සෑම අංශයකින්ම දක්ෂතම සාමාජිකයා**
එස්. ඩී. පියදාස මහතා

# ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
# The National Photographic Art Society of Sri Lanka

## විභාග නිර්ණායක

### අරමුණු
සංගමය මගින් පවත්වන තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ විභාග සහ ඇගැයීම් සම්බන්ධ කාර්ය පටිපාටිය විධිමත් හා වගකිවයුතු මට්ටමකින් පවත්වාගෙන යාම මෙම චක්‍රලේඛයෙන් අරමුණු කෙරේ.

### අර්ථ නිරූපණය
සංගමයේ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ ඇගැයීම් සඳහා ඇතුළත් සියලු ම අංශවල පරීක්ෂණ මෙම චක්‍රලේඛයෙන් ආවරණය කෙරේ.

### නිර්දේශ
1. පාඨමාලා ඇගයීම් පිළිබඳ ව්‍යුහය.

1.1. ප්‍රථම වර්ෂ විභාගය

| | |
|---|---|
| ලිඛිත ප්‍රශ්නපත්‍රය I - පැය 01 යි | ලකුණු 100 |
| ලිඛිත ප්‍රශ්නපත්‍රය II - පැය 02 යි | ලකුණු 100 |
| ප්‍රායෝගික පත්‍රය | ලකුණු 100 |

1.2. දෙවන වර්ෂ විභාගය

| | |
|---|---|
| ලිඛිත ප්‍රශ්නපත්‍රය I - පැය 01 යි | ලකුණු 100 |
| ලිඛිත ප්‍රශ්නපත්‍රය II - පැය 02 යි | ලකුණු 100 |
| ප්‍රායෝගික පත්‍රය | ලකුණු 100 |

1.3. තෙවන වර්ෂ විභාගය

| | |
|---|---|
| ලිඛිත ප්‍රශ්නපත්‍රය I - පැය 01 යි | ලකුණු 100 |
| ලිඛිත ප්‍රශ්නපත්‍රය II - පැය 02 යි | ලකුණු 100 |
| ප්‍රායෝගික පත්‍රය | ලකුණු 100 |
| නිබන්ධනය හෝ සමාන්තර ඇගයීම | ලකුණු 100 |

1.4. විභාග සාමාර්ථ්‍යය

පරීක්ෂණයේ සෑම කොටසක ම සාමාර්ථ්‍යය සඳහා අවශ්‍ය අවම ලකුණු සංඛ්‍යාව 40 කි. එහෙත් අදාළ විශේෂිත හේතු කිසිවක් වේ නම් ඒ පිළිබඳ සලකා බලා ලකුණු මට්ටමෙහි පහත හෙළීමක් සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි ලේඛකාධිකාරීවරයාට අවසර ඇත.

02. විභාග අපේක්ෂකත්වය

2.1. සංගමයේ සාමාජිකත්වය ලබා ඇති සහ සාමාජිකත්වය යාවත්කාලීන කොටගෙන ඇති සාමාජික භවතුන්ට ප්‍රථම, දෙවන, සහ තෙවන වසරවල විභාග සඳහා ඉදිරිපත් විය හැකි ය. තව ද අදාළ නිල වර්ෂයේ අධ්‍යයන කාර්යයන් සඳහා 50% ක අවම පැමිණීමක් ඒ සඳහා සලකා බලනු ලැබේ.

2.2. ප්‍රථම වර්ෂ පරීක්ෂණය සඳහා පමණක් සංගමයේ සාමාජිකයනට අමතර ව බාහිර අපේක්ෂකයනට ඉදිරිපත් විය හැකි අතර, දෙවන වසර විභාගයට ඉදිරිපත් විය හැක්කේ ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සහ නිර්දේශිත සංගම්වල සාමාජිකයනට පමණි. තෙවන වසර (ඩිප්ලෝමා) පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා සෑම අපේක්ෂකයෙකු ම සංගමයේ සාමාජිකත්වය ලබා තිබීම අනිවාර්ය වේ.

2.3. විභාග අපේක්ෂකත්වය සඳහා අදාළ දිනයට පෙර නියමිත අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කොට විභාග ගාස්තු ද සමග විභාග ලේඛකාධිකාරීවරයා වෙත හෝ ඔහු විසින් පත් කර ඇති නියෝජිතයා වෙත භාරදිය යුතු ය.

2.4. විභාග සඳහා නියමිත ප්‍රවේශපත් අවම වශයෙන් දින 10 කට පෙර ලේඛකාධිකාරීවරයා විසින් අපේක්ෂකයා වෙත යොමු කළ යුතු අතර, අස්ථානගත වන ප්‍රවේශපත් සම්බන්ධ අවස්ථානුකූල ක්‍රියාමාර්ගවලට එළැඹීමේ වගකීම ලේඛකාධිකාරීවරයා සතු වේ.

2.5. මොන යම් හෝ හේතුවක් නිසා වත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවීමක් සිදු නොකෙරේ.

2.6. අපේක්ෂකයා විභාගයේ ලිඛිත පරීක්ෂණය අසමත් වුවහොත් හෝ නොපැමිණියහොත් හෝ ඉන් පසු පැවැත්වෙන වාර්ෂික පරීක්ෂණයක් සඳහා නැවත නව අපේක්ෂකයකු වශයෙන් අයදුම් කළ යුතු ය.

2.7. විභාගයේ ලිඛිත පරීක්ෂණය සමත් වී, ඉතිරි ඇගයීම් කටයුතු අසමත් වුවහොත් හෝ ඒවාට නොපැමිණියහොත් ඉන් පසු වසරක පැවැත්වෙන පරීක්ෂණ සඳහා ඉදිරිපත් විය හැකි ය. එහෙත් ඒ සඳහා ලැබෙන්නේ ඉදිරි වසරක කාලසීමාවක් පමණි.

2.8. විභාගයේ ලිඛිත පරීක්ෂණයෙන් ඌන සාමාර්ථ්‍යයක් ලබා ඇත්නම් සමත් වීමට අවශ්‍ය සම්පූර්ණ ලකුණු ප්‍රමාණය ඉතිරි ඇගයීම් මගින් උපයා ගැනීමට අවකාශ ඇත. එහෙත් එම කාර්යය අදාළ නිල වර්ෂය තුළ සම්පූර්ණ කළ යුතු ය.

2.9. පළමු වසර පරීක්ෂණය සඳහා කිසිදු පූර්ව සුදුසුකමක් අවශ්‍ය නොවන නමුදු, දෙවන වසර පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීමට පළමු වර්ෂ පරීක්ෂණයේ ලිඛිත සහ ප්‍රායෝගික කොටස් සාමාර්ථ්‍යය ලබා තිබිය යුතු වේ. තෙවන වසර පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීම සඳහා ද දෙවන වසර පරීක්ෂණයේ ලිඛිත හා ප්‍රායෝගික කොටස් සාමාර්ථ්‍යය ලබා තිබිය යුතු ය.

2.10. ඡායාරූප ශිල්පය පිළිබඳ ඩිප්ලෝමාව ලබාගැනීම සඳහා ප්‍රථම, දෙවන, සහ තෙවන වසරවල විභාගවල ලිඛිත පරීක්ෂණ සියල්ල ද, ප්‍රයෝගික පරීක්ෂණ සියල්ල ද, නිබන්ධන සහ/හෝ අදාළ නිර්දේශිත ඇගයීම් සියල්ල ද නියමිත කොන්දේසි ප්‍රකාර ව සපුරා තිබිය යුතු වේ.

03. විභාග පැවැත්වීම.

3.1. කැලැන්ඩර වර්ෂයක් අධ්‍යයන වර්ෂයක් සේ සලකා වර්ෂාවසානයේ විභාග පැවැත්වීමට කටයුතු සංවිධානය කිරීම ලේඛකාධිකාරීවරයාගේ වගකීමකි.

3.2. ඉල්ලුම් කර ඇති විභාග අපේක්ෂකයින්ගේ අභිමතය සහ කළමනාකරණ පහසුව පරිදි අගනුවර සහ පිටස්තර ප්‍රදේශවල ලිඛිත පරීක්ෂණය එක ම දිනෙක එක ම අවස්ථාවක පැවැත්වීමට විධිවිධාන යෙදීම ලේඛකාධිකාරීවරයාට භාර වේ.

3.3. රහස්‍ය භාවය සුරැකෙන පරිදි ප්‍රශ්න පත්‍ර පිළියෙල කොට නිසි ලෙස මුද්‍රා තබා, අවශ්‍ය අතිකුත් කළමනා ද සමග ඒවා විභාග ශාලාව වෙත නියමිත වේලාවට සැපයීමට ලේඛකාධිකාරීවරයා පියවර ගත යුතු ය.


3.4. විභාග ශාලාධිපතිවරු, නිරීක්ෂකවරු, ශාලා සහායකවරු, ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩල සාමාජිකවරු සහ පිළිතුරුපත් පරීක්ෂකවරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි පත් කිරීම සහ ඔවුන්ට අවශ්‍ය උපදෙස් සැපයීම ද අවශ්‍ය පහසුකම් සැලැස්වීම ද ලේඛකාධිකාරීවරයාට පැවරෙන වගකීමකි.

04. ඇගයීම් කටයුතු සංවිධානය.

4.1. විභාගයේ ලිඛිත පරීක්ෂණ අවසන් වූ විගස පිළිතුරු පත්‍ර තමා භාරයට ගෙන ඒවා ඇගයීමට කටයුතු යෙදීම ලේඛකාධිකාරීවරයාගේ වගකීමකි.

4.2. විභාගයෙන් තෙමසක් ඇතුළත ලිඛිත කොටසේ ප්‍රතිඵල නිකුත් කළ යුතු අතර, ඊළඟ තෙමස ඇතුළත ප්‍රායෝගික පරීක්ෂණ ද, නිබන්ධන හා අනිකුත් සමාන්තර ඇගයීම් ද සමාප්ත කිරීමට ලේඛකාධිකාරීවරයා වගබලාගත යුතු ය.

## වාර්ෂික දෙදින චාරිකාව



හැටන්, මස්කෙළිය, ඇබර්ඩීන් දිය ඇල්ල ඇතුළු කඳුකරයේ සුන්දර ස්ථාන නැරඹීම හා ඡායාරූප ගත කිරීම අරමුණු කරගනිමින් සංවිධානය කෙරුණු මෙවර වාර්ෂික දෙදින චාරිකාව ජනවාරිමස 07 සහ 08 දිනවල දී පැවැත්විණි. මෙවර චාරිකාව සඳහා ඉතා අඩු සාමාජික පිරිසක් සහභාගී වූ නමුත් ඊට එක් වූ සැමට සාර්ථක චාරිකාවක් අත්විඳීමේ භාග්‍යය උදාවිය. චාරිකාව සංවිධාන කටයුතුවල දී මනා සහයක් ලබාදුන් බන්දු ගුණරත්න මහතාට හා එස්. රාම්දාස් මහතාට සමාජසේවා හා සුභ සාධන කමිටුවේ ස්තූතිය හිමිවේ.

### කුරුණෑගල ඡායාරූප සංගමයේ 32 වන වාර්ෂික ඡායාරූප තරගය සහ ප්‍රදර්ශනය 2012

කුරුණෑගල ඡායාරූප සංගමයේ 2012 වාර්ෂික ඡායාරූප තරගය හා ප්‍රදර්ශනය 2012 පෙබරවාරි මස 25,26 හා 27 දිනවල කුරුණෑගල Y.M.B.A. ශාලාවේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම තරගයේ කෘති භාරගන්නා අවසාන දිනය පෙබරවාරි මස 10 වේ.

### කුරුණෑගල ඡායාරූප සංගමයේ ඡායාරූප පාඨමාලාව

කුරුණෑගල ඡායාරූප සංගමය මගින්, ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 3 අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු වසර සඳහා පවත්වනු ලබන ඡායාරූප පාඨමාලාවට නවක සිසුන් බඳවාගැනීම දැන් සිදු කෙරේ. මේ සඳහා තම නම සහ ලිපිනය ලියන ලියූ මුද්දර කවරයක් සමග රු 5/= මුද්දර 5 ක් 2012 පෙබ. 15 ට පෙර එවීමෙන් අයදුම් පත්‍රය ලබාගත හැකි ය.

ඡායාරූප ප්‍රදර්ශනය සහ ඡායාරූප පාඨමාලාව පිළිබඳ අයදුම්පත් සහ වැඩි විස්තර ගරු ලේකම්, කුරුණෑගල ඡායාරූප සංගමය, නො. 10, දඹුල්ල පාර, කුරුණෑගල යන සංගමයේ ලිපිනයෙන් ලබාගත හැකි වේ.

## අපේ ශෝකය

■ හිටපු ගරු සභාපති අධ්‍යක්ෂ උදිත ගයාෂාන් ගුණසේකර මහතාගේ දයාබර නැන්දණිය පසුගිය දා අභාවප්‍රාප්ත වූවා ය. ඒ පිළිබඳ ශෝකය මෙයින් පිරිනමමු.

■ යාවජීව සාමාජික සමන්ත ගමගේ මහතාගේ දයාබර මෑණියන් මෙන් ම සාමාජිකා නිශාමලී ජයසේකර මහත්මියගේ දයාබර නැන්දණිය පසුගිය දා අභාවප්‍රාප්ත වූවා ය. එතුමියගේ අභාවය පිළිබඳ සංගමයේ ශෝකය මෙයින් පළ කර සිටිමු.

■ සාමාජික රොෂාන් පෙරේරා මහතාගේ දයාබර පියාණන් ද පසුගිය දා අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳ සංගමයේ ශෝකය මෙසේ පළ කරමු.

## මාසික ඡායාරූප තරඟ ප්‍රතිඵල

### 2011 ඔක්තෝම්බර් 30 මීගමුව වෙරළ ඡායාරූප තරගය දොස්තර එම්. එස්. වීරකෝන් ශූරතා පළිහ

**සමස්ථ කලුසුදු ප්‍රතිඵල**

1. ජයනාත් කුමාර ඉලංගකෝන් (එම්.එස්. වීරකෝන් ශූරතාවය)
2. දර්ශිත ෆොන්සේකා
3. එම්.ඒ. ඉඳුනිල් ජීවන්ත
4. ජයනාත් කුමාර ඉලංගකෝන්
5. එල්.ඒ.අයි. කරුණාරත්න

**සමස්ථ වර්ණ ප්‍රතිඵල**

1. දර්ශිත ෆොන්සේකා
2. පී.යූ.ඩී. හිඳුල්ලආරච්චි
3. ජයනාත් කුමාර ඉලංගකෝන්
4. ආර්.ඒ. නිමාෂා
5. දර්ශිත ෆොන්සේකා

**ඡායාරූප තේරීම් කමිටුව**

ප්‍රියන්ත අමරසිංහ මහතා
චන්ද්‍රසේන පෙරේරා මහතා
රෝහිත ගුණවර්ධන මහතා.

### 2011 නොවැම්බර් මාසික ඡායාරූප තරගය

**සමස්ථ කලුසුදු ප්‍රතිඵල**

1. ජයනාත් කුමාර ඉලංගකෝන්
2. දිල්ෂාන් නයනජිත්
3. තිසල් කලුආරච්චි
4. එම්.ඒ. ඉඳුනිල් ජීවන්ත
5. ජේ.ඒ. ජයලත් ප්‍රේමවංශ

**සමස්ථ වර්ණ අංශය**

සුදුසු නිර්මාණ නොවීය.

**ඡායාරූප තේරීම් කමිටුව**

දී.ග. සෝමපාල මහතා
නාරද අමරතුංග මහතා
සම්පත් පීරිස් මහතා

**ත්‍යාග අනුග්‍රහය**

සේයාකලර් ඩිජිටල් වර්ණ රසායනාගාරය කළුබෝවිල
එල්.බී.එස්.එස්. බාලසූරිය මහතා

## මිහිරිපුර අභිමානී

මිහිරිපුර අභිමානී සංවර්ධන පදනම සංවිධානය කළ අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනය සහ සැණකෙළිය 2011 දෙසැ: 14 සිට 18 දින දක්වා මීරිගම යොවුන් නිකේතන පරිශ්‍රය හා නගර සභා පිටියේ දී පැවැත්විණි. එම පදනමේ ආරාධනයෙන් අප සංගමයේ ප්‍රදර්ශන කුටියක් එහි දී පවත්වන ලදී. ඡායාරූප ශිල්පයේ විකාශනය හා දියුණුව විදහා දක්වීම, ඊට අදාල අධ්‍යාපනික තොරතුරු ලබාදීම මෙන්ම අප සංගමය හා එහි කාර්යභාරය පිළිබඳව නරඹන්නන් දැනුවත් කිරීමටද මෙහි දී හැකිවිය.